# තැනට සුදුසු නුවණ



ඉමාෂි මෙත්සරා පීරිස්.

කෘතියේ නම : තැනට සුදුසු නුවණ.

2025

කතෘ ප්‍රකාශනයකි.

ISBN:  978-624-208-739-9



කථාව සහ චිත්‍ර - ඉමාෂි මෙත්සරා පීරිස්.

පාසල - මහාමායා බාලිකා විද්‍යාලය,මහනුවර.

ඉගෙනුම ලබන පංතිය  3 වසර B

කර්තෘගේ වෙනත් කෘති: මූව යාලුවෝ

කෘතිය ප්‍රකාශිත දිනය: 2025.02.08

# පිදුම

කුඩාකල සිට අකුරු කියාදුන්

සියලුම ගුරුවරුන්ට සහ පියවරුන්ටත්

මාගේ දෙමව්පියන්ටත්

මෙම පොත ගෞරවයෙන් පුදමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ,දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය.එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට ගත් කතුවරියන් සමත් වීම සුවිශේෂී සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර් පාසල් ප්‍රජාවම ආදි කර්තෘකරදන අත්තදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදායම රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන හෙරණගත්කරණී ව්‍යාපෘතිය හඳුන්වාදෙන්නට විය. මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනියෙන් මාහට අබිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාවය හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය ,

ශෂිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකමත් එක දවසක හා හාමී කෙනෙක් හිටියා.

එයා ගොඩක් බුද්ධිමත් හා හාමි කෙනෙක්, කැලෑවේ ඉන්න හැම සතෙකුටම පුළුවන් විදියට උදව් කළා.



එයාට ඒ නිසා කැලෑවේ ගොඩක් යාළුවො හිටියා.

ඒ හැම යාලුවෙක්ම හා හාමිට හරිම ආදරෙයි.

හැමෝම එයත් එක්ක සෙල්ලම් කරනවා.

එයා හැමෝටම තමන් දන්න දේ කියලා දෙනවා.

දවසක් හා හාමි යාළුවොත් එක්ක සෙල්ලම් කරලා හොඳටම හවස් වුණා.

වෙලාව යනවා දැනුනෙම නෑ.



ඉතිං හාහාමි ගෙදර යන්න පිටත් වුනා.

ගෙදර යන්න තියෙන්නෙ ලොකු කැලෑවක් මැදින්, ටිකක් හවස් වෙලා නිසා හාහාමිට ගොඩක් බය හිතුනා.

තවත් රෑ වෙන්න කලින් ගෙදර යන්න ඕන නිසා කැලේ මැදින් ඉක්මනට ඉක්මනට දුවගෙන ගියා.



වටපිට බල බලන්න හාහාමී ඉක්මනින් දුවගෙන දුවගෙන ගෙදර යද්දී ගහක් අස්සේ  ඉදන් බලාගෙන හිටපු කොටියෙක් හාහාමීව අල්ලගන්න හාහාමීගේ ඇඟට පැන්නා.

හාහාමි හොඳටම බය වුණා.

''ඒත් මේ කොටියාට බය පෙන්නුවොත් එයාමාව ඉක්මනින්ම මරාදමාවි''

හාහාමි හිතුවා.




හාහාමි කොටියාට බය පෙන්නන්නේ නැතුව කොටියාදෙස බලලා සමච්චලයට හිනාවෙලා
“ඔබට මාව කන්න ලැබෙන්නැහැ”
කියලා කිව්වා.

‘’ඇයි බැරි මට නුඹව කන්න’’
කොටියාඇහුවා
“ඔබ දන්නවද මං තමයි මේ කැලේ රජ්ජුරුවෝ’’
හාහාමි කිව්වා.
කොටියාහිනාවෙලාකිව්වා.
“ඔයා කියන ඒවා මට විශ්වාස කරන්න බැහැ,ඔයා කොහොමද කැලෑවේ

රජ්ජුරුවෝ වෙන්නෙ, කැලෑවේ රජ්ජුරුවෝ සිංහයානෙ!! ඉතින් ,

කොහොමද මම නුඹ කියන දේ විශ්වාස කරන්නේ’’

‘‘එන්න මං පෙන්වන්නම්’’ කියලා කොටියාව හාහාමි කැලේ මැදට එක් කරගෙන ගියා.



කොටියාව දැක්ක ගමන් කැලේ මැද හිටපු සත්තුන් ඔක්කොමලාම  දුවන්න පටන් ගත්තා.

 හාවො,මුවෝ,කුරුල්ලෝ හා පැංචාගේ

යාළුවොත් එතන හිටියා.

හාහාමි ජයග්‍රාහී විදිහට  කොටියා දිහා බැලුවා.

කොටියාහොඳටම බය වෙලා.

‘’අනේ මට සමාවෙන්න හාහාමි

මම දැනගෙන හිටියේ නෑඔයාතමයි දැන් ඉන්න රජ්ජුරුවෝකියලා‘’

කොටියාබෑගෑපත්ව කිව්වා.

හාහාමිට හරි  හිනා.

බොහොම අමාරුවෙන් හිනාව තද කරගෙන හිටියා.



මේ තමයි අලුත් රජ්ජුරුවෝ ඒකනේ මෙයාට ඔක්කොලාම සතුන් බයවෙලා දිවුවේ.

කොටියාහිතුවා.

සතුන් දිවගියේ හා හාමිට බයේ නෙමෙයි හා හාමි සමග සිටි තමන්ට බයේ බව කොටියාට තේරුම් ගන්න බුද්ධියක් තිබුණේ නෑ



**තැනට සුදුසු නුවන පාවිච්චි කරලාහාහාමි පණ බේරාගත්තා.**

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප් නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් ගත් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙසේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප , පළාත් , ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය , දියණියන් , ගුරුභවතුන් , දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකියි මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතුවී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේ පාසැල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගාදී තිබේ. තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචිගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂින්සන.

ව්‍යාපෘති නිර්මාතෘසම්බන්ධීකාරක ,

සෙනවිරත්න මහලේකම්.